**රාජ්‍ය මුද්‍රණ සංස්ථාව - 2015**

**------------------------------------**

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01**

ගිණුම්කරණ ප්‍රමිතිය මගින් අවශ්‍ය කරන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා බැරකම් හිලව් නොකළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය සහ පුද්ගලික අංශයෙන් අයවිය යුතු රු. 499,251,402 ක්වූ මුළු ණය ශේෂයෙන් රු. 4,409,866 ක මුළු බැර ශේෂය අඩුකර රු. 494,841,536 ක ශුද්ධ ණය ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02**

අවසන් තොගය ගණනය කිරීමේදී, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුව ද, අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ තක්සේරුවක් සංස්ථාව විසින් සිදු කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08**

(i) සංස්ථාව විසින් ඉකුත් වර්ෂ වලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කිරීම වෙනුවට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුළ පෙර වර්ෂයේ ගැලපුම් ලෙස රු. 11,914,381 ක මුදලක් දක්වා තිබුණු අතර ඊට අදාළ තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 200,033,440 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16**

ඉඩම්, ගොඩනැගිලි හා යන්ත්‍ර ඇපයට තබා රු. 624,552,578 ක ණය මුදලක් ලබා ගැනීම සම්බන්ධ විස්තර සහ උකසේ ස්වභාවය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසල් පෙළ පොත් මුද්‍රණය කර නියමිත දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර නොදීම හේතුවෙන් ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ රු. 28,496,348 ක ප්‍රමාද ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,586,947ක ක්ෂයවීම් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 2.5 ක් ණයගැතියන් වෙනුවෙන් හානිකරණය ලෙස වෙන්කර තිබුණද, සමස්ත ණයගැතියන්ගෙන් රු.64,551,594 ක් අවුරුදු 5 ඉක්මවා තිබීම නිසා එය අයනොවීමේ සම්භාවිතාවයක් පවතින බැවින් වෙන්කරන ලද ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවීම් රු.16,937,575 ක් වුවද උපලේඛනය අනුව එම ශේෂය රු.16,677,834 ක් වූයෙන් රු.259,741 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විස්තරය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | වෙළඳ ණයගැතියන් | 673,119,568 | ණයගැති පාලන ගිණුම සහ ණයගැති කේවල ගිණුම් |
| (ආ) | වෙළඳ ණයහිමියන් | 53,840,285 | ශේෂ සනාථ කිරීම්, ණයහිමි කේවල ගිණුම් සහ ණයහිමි පාලන ගිණුම |
| (ඇ) | වෙනත් ණයහිමියන් | 1,076,244 | ලෙජර් ගිණුම් සහ ශේෂ සනාථ කිරීම් |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 673,119,568 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු. 64,551,594 ක හිඟ ණය ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය රු.53,840,285 ක් වූ අතර ණයහිමි කාල විශ්ලේෂණයට අනුව වසර 2ත් 5ත් අතර බේරුම් නොකරන ලද

ණයහිමියන්ගේ වටිනාකම රු.17,865,079 ක් විය. මෙය මුළු ණයහිමියන්ගෙන් සියයට 33ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික කඩදාසි සමාගමෙන් රු.9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු.7,460,675 ක් විය. මෙම ණය ශේෂ තුළ වසර 02 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු.7,989,976ක් සහ රු.5,578,142ක් වූ නමුත් මෙම ගණුදෙනු හඳුනාගෙන එම ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත (26) (1) උපවගන්තිය. | එකතු කළ අගය මත බදු මුදල් බදු අය කළ හැකි කාල සීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු. 35,230,511 ක් වූ එකතු කළ අගය මත බදු 2016 ජනවාරි 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත 4 වන වගන්තිය. | එක් එක් කාර්තුවට අදාළ ජාතිය ගොඩ නැගීමේ බදු මුදල් අදාළ කාර්තුව අවසානයට පසුව එළඹෙන මාසයේ විසිවෙනි දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එකතුව රු. 62,426,710 ක් වූ ජාතිය ගොඩ නැගීමේ බදු 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.7 වගන්තිය. | සංස්ථාවේ නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 853,371 ක් වූ උපයන විට ගෙවීමේ බදු මුදල් සංස්ථා අරමුදලින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,111,384 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,530,670 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 39,419,286 ක පිරිහීමක් නිරීක්ෂණය

විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු. 33,517,802 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදි 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට එය ක්‍රමයෙන් අඩුවී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු. 468,656,443 ක් වූ සංස්ථාවේ දායකය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී එය රු. 565,260,550 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂය හා සැසඳීමේදී දළ ලාභ අනුපාතය සියයට 34 සිට සියයට 29 දක්වා අඩු වී තිබුණු අතර සංස්ථාවේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 5 සිට සියයට 0.2 දක්වා අඩුවීම නිසා සංස්ථාවේ ලාභදායීත්වය පිරිහීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ බදුපෙර ලාභය පිරිහීම නිසා පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පොළී ආවරණ අනුපාතය වාර 2.12 සිට වාර 1.1 දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත හා එයට පසුව හඳුන්වාදුන් සංශෝධිත පනත් අනුව සාරාංශ කරන ලද සංස්ථාවේ අරමුණු පහතින් දැක්වේ.

(අ) රජය, පළාත් පාලන ආයතන, ලිඛිත නීතියකින් සංස්ථාපිත රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පුද්ගලික ආයතන හෝ පුද්ගලයෙකුගේ මුද්‍රණ හෝ ප්‍රකාශන කාර්යයන් ඉටු කිරීම.

(ආ) ලිපි ද්‍රව්‍ය හා වෙනත් අනුයාත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, මිලදී ගැනීමේ, විකිණීමේ කාර්යය භාර ගැනීම.

(ඇ) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන පොත් පත්, අධ්‍යාපනික ආධාරක පුවත්පත් සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීමේ, බෙදාහැරීමේ, අපනයනය කිරීමේ හා ආනයනය කිරීමේ කාර්යය භාර ගැනීම.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

ක්‍රමවත් අලෙවි සැලසුම් පිළියෙල කිරීමෙන් තොරව ලිපි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හේතුවෙන් රු. 39,518,977 ක් වූ පෙර වර්ෂයේ ලිපිද්‍රව්‍ය අවසන් තොගයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලිපිද්‍රව්‍ය තොගය රු. 17,648,818 කින් එනම් සියයට 44 කින් වැඩි වී තිබුණි.

### 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

වෙළඳපොල පුරෝකථනයකින් තොරව නිෂ්පාදන සැලසුම් පිළියෙල කිරීම නිසා 2012 සහ 2013 වර්ෂයන්හි දී නිෂ්පාදනය කරන ලද විකුණුම් මිල රු.4,770,110 ක් වූ අභ්‍යාස පොත් තොගය 2016

ජනවාරි මාසය වන විටත් නොවිකිණී තිබූ අතර වර්තමානයේදී මෙම පොත් තොගය ගුණත්වයෙන් බාල තත්ත්වයට පත්වී තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

පැරණි හිඟ ණය අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කොමිස් මුදල් ගෙවීමේ පදනම මත සංස්ථාවේ නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පැරණි ණය ශේෂ අය කිරීම වෙනුවට 2013 සහ 2014 වර්ෂයන්ට අදාල ණය අයකර ගැනීම වෙනුවෙන් රු.246,509 ක කොමිස් මුදල් ගෙවා තිබුණි.

**4.5 හඳුනා ගන්නා ලද පාඩු**

සංස්ථාවේ පොත් හා ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය කඩදාසි තොග නිසි පරිදි ගබඩා කර නොතිබීම නිසා පිරිවැය රු. 461,037 ක් වූ කඩදාසි තොගයක් හානි වී තිබූ අතර එම තොගය සමාලෝචිත වර්ෂයේදී රු. 93,756 කට අලෙවි කිරීමෙන් රු. 367,281 ක පාඩුවක් සිදුවී තිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

විධිමත් පැවරීමකින් තොරව සංස්ථාව සතු ඉඩමෙන් අක්කර 13 රූඩ් 2 පර්චස් 06 ක ප්‍රමාණයක් කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරාදී තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

වෙළඳපොල හැසිරීම නිරීක්ෂණය කිරීම හා වෙළඳපොල පර්යේෂණ සිදු කිරීම සඳහා අලෙවි පර්යේෂණ නිලධාරියකු 2013 නොවැම්බර් 01 දින පත් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු අලෙවි පර්යේෂණයක් සිදුකර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් සැසඳීමේදී වියදම් අයිතම 36 කට අදාලව සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

මුදල් පොත යාවත්කාලීනව තුලනය කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා මුදල් බැංකු ගත කිරීම සම්බන්ධව මූලා පාලන පද්ධතියේ අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.